# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක:**14/2016**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 සැප්තැම්බර් මස 28 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

## උපකුලපති තනතුරට පත් කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් 2006.12.11 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 15/2006 මඟින් සංශෝධිත 2006.08.15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 880 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

උපකුලපති තනතුරට පත් කිරීම් සිදු කිරීමේ දී අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය සළකා බැලූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ඡන්ද විමසීමේ දී අපේක්ෂකයන් විසින් 1වන, 2වන හෝ 3වන ස්ථාන සඳහා සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් අවස්ථාවන්හි දී තවදුරටත් අනුගමනය කළ යුතු උපදෙස් ඇතුළත් කිරීමට සහ අනෙකුත් ඇතැම් මාර්ගෝපදේශ සඳහා පියවර කීපයක් එකතු කිරීමට ද 2016.09.08 දින පැවති සිය 948වන සභා වාරයේදී තීරණය කරන ලදී.

ඒ අනුව, උපකුලපති තනතුරට පත් කිරීම සඳහා වන සංශෝධිත පරිපාටිය පහත දක්වා ඇත;

1. පුවත්පත්වල පළ කරන ලද දැන්වීමක් මඟින් තනතුර සඳහා අයදුම්පත් / නාම යෝජනා කැඳවිය යුතු වන්නේය.

2. අයදුම් කිරීමට විශිෂ්ට පුද්ගලයන් සෙවීම සහ පෙළඹවීම සඳහා මහාචාර්ය හෝ ඉහළ ධූරයක් දරන ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) සමන්විත සුදුසු සෙවීම් කමිටුවක් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත් කළ යුතු වන්නේය. සෙවීම් කමිටුවේ සාමාජිකයන්ගෙන් අවම වශයෙන් එක් අයෙකු හෝ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන පීඨාධිපතිවරයෙකු විය යුතුය.

3. විශ්විවිද්‍යාලයේ සංවර්ධනය සඳහා දැක්ම ඇතුළත් ප්‍රකාශයක්, උපකුලපති තනතුරට පත් කළ හොත් ඉටු කර ගැනීමට ඔහු/ ඇය විසින් යෝජනා කරන්නේ කුමක්ද යන්න ගැන කෙටි විස්තරයක් සහ අයදුම්කරුගේ උපන් දිනය ඇතුළත් සම්පූර්ණ ජීව-දත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කරන මෙන් අයදුම්කරුවන්ට දැන්විය යුතු වන්නේය.

4. වර්තමාන උපකුලපතිවරයා අයදුම්කරුවෙකු වන අවස්ථාක දී, ඉහත 03 වගන්තියේ සඳහන් ලේඛනවලට අමතරව, ඔහු / ඇය විසින් ඔහුගේ/ ඇයගේ පළමු ධූර කාලය තුළ දී සපුරා ගත් අර්ථසිද්ධීන් ඉස්මතු කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වන්නේය.

5. එක් එක් අයදුම්කරුවාගේ සුදුසුකම්, වෘත්තීය අත්දැකීම්, සහ දැක්ම ඇතුළත් ප්‍රකාශය පිළිබඳ ඇගයීමක් පාලක සභාව වෙත වාර්තා කිරීම සඳහා, උපකුලපති තනතුරට අයදුම්කරුවෙකු හෝ නම්කරන ලද තැනැත්තකු වීමට අදහස් නොකරන පාලක සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) සමන්විත වන ඇගයීම් කමිටුවක් පාලක සභාව විසින් පත් කළ යුතු වන්නේය.

6. ඡන්දය විමසන දිනට අවම වශයෙන් දින තුනකට (03) ප්‍රථමව, ඉහත 3 සහ /හෝ 4 වගන්ති ප්‍රකාරව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද සියලු ලේඛනවල පිටපත් සමඟ ඊළඟ උපකුලපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා විශේෂ පාලක සභා රැස්වීමක් පැවැත්වීමේ නිවේදනය, සියලුම පාලක සභා සාමාජිකයන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද නිරීක්ෂකයා වෙත නිසි පරිදි සංසරණය වූ බවට පාලක සභාවේ ලේකම්වරයා විසින් තහවුරු කළ යුතු වන්නේය.

7. පාලක සභාවේ ලේකම්වරයා විසින්, ඡන්දය පැවැත්වීමට ප්‍රමාණවත් කාලයකට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිරීක්ෂකයකු පත් කිරීම සඳහා ඉල්ලීමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

8. උපකුලපති තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද සියලු අපේක්ෂකයන් ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර පාලක සභාව වෙත අවම වශයෙන් මිනිත්තු දහයක (10) කාල සීමාවකින් යුතු කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා ආරාධනා ලබනු ඇත. පාලක සභාව විසින් අපේක්ෂකයන් තිදෙනෙකු නම් කළ යුතුව ඇති බැවින්, සුදුසුකම් ඇති සියලු අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් ඡන්ද පත්‍රිකාවක් පිළියෙල කළ යුතු අතර පාලක සභාව රහස් ඡන්දයකින් ඡන්දය ප්‍රකාශ කිරීම මගින් අවසන් තීරණය ගනු ඇත. සෑම පාලක සභා සාමාජිකයෙකුම අපේක්ෂකයන් තිදෙනෙකු සඳහා ඡන්ද 03ක් ලබා දීමට හිමිකම් ලබයි. පාලක සභා සාමාජිකයකු අපේක්ෂකයකු වන්නේ නම් ඔහු /ඇය ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලබයි.

9. ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ දී, අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් පළමු, දෙවන හෝ තෙවන ස්ථාන සඳහා සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ඇත්නම් තවත් ඡන්ද විමසීමක් සඳහා පාලක සභාවට බලය ඇත්තේය. අනතුරුව සිදු කරන ඡන්ද විමසීම සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් අපේක්ෂකයන්ට සීමා විය යුතු අතර පෙර ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිවේදනය කල වහාම එය සිදු කළ යුතුය.

10. වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් පුද්ගලයන් තිදෙනාගේ (03) නම් ඉහත 3 සහ 4 වගන්තිවල සඳහන් ලේඛන සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. ඉදිරිපත් කරන ලබන නම් තුන ශ්‍රේණිගත කිරීමට තීරණය කරන්නේ නම් වැඩිම ඡන්ද ලබා ගත් අනුපිළිවෙළට ශ්‍රේණිගත කිරීම සිදු කළ යුතු වන්නේය.

11. ප්‍රචාරක දැන්වීම මගින් අයදුම්පත් තුනක් සොයා ගැනීමට නොහැකි වූ විට, ප්‍රචාරක දැන්වීම වඩා පුළුල් ලෙස පළ කරමින් ක්‍රියාවලිය අලුතින් ඇරඹිය යුතු වේ. මෙය විශ්වවිද්‍යාල කොමිෂන් සභාව වෙත යොමු කිරීමට තිදෙනෙකු හඳුනා ගන්නා තෙක් නැවත නැවත සිදු කළ යුතු වේ.

මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2016.10.03 දින සිට ක්‍රියාත්මක වන අතර, ඒ අනුව 2006 අගෝස්තු 15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 880 සහ 2006 දෙසැම්බර් 11 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 15/2006 එදින සිට අවලංගු කෙරේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/3/238